# තොරොක්කෝව

**විෂයය** : සිංහල භාෂාව හා සාහිත්‍යය

**ශ්‍රේණිය** : 10

**වාරය** : දෙවන වාරය

**නිපුණතාව** : **11.0** රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : **11.1** සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනා ගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි.

## ක්‍රියාකාරකම්

1) තොරොක්කෝව කතාවේ රචකයා හා පරිවර්තකයා නම් කරන්න.
2) ර්යෝහෙයිගේ බලාපොරොත්තුව කුමක් ද ?
3) තොරොක්කෝව තල්ලු කිරීමට ගිය තිදෙනා කවුරුන් ද ?
4) "කවුද උඹලාට ඔය තොරොක්කෝව අල්ලන්න කිව්වේ" මෙය කවුරු කළ ප්‍රකාශයක් ද ?
5) ර්යෝහෙයි තරුණයන් දෙදෙනා සමග මිත්‍ර වූයේ කුමක් සඳහා ද ?
6) තොරොක්කෝව පීලි දිගේ වේගයෙන් පහළට බසින විට දැනුණු සුවඳ කුමක් ද ?
7) බොහෝ දුර ගමන් කළ තොරොක්කෝව නැවතුණේ කුමන ස්ථානයක දී ද ?
8) ර්යෝහෙයි ආපසු ගෙදර යාමට සිතුවේ කුමක් දැකීමෙන් ද ?
9) ර්යෝහෙයි පිළිබඳ පාඨක සිත්හි අනුකම්පාවක් ඇතිවන කාරණා මොනවා ද ?
10) ඔහු නගරයට පැමිණි බව කතුවරයා සඳහන් කිරීමට පාදක කරගත් පාරිසරික අංග මොනවා ද ?
11) ගමන අවසානයේ ර්යෝහෙයි ඇඬූ කාරණය කුමක් ද ?

**<u>හුණුවටයේ කතාව</u>**

**නිපුණතාව** : **12.0** අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : **12.3** නාට්‍ය පිටපත් රචනයේ යෙදෙයි.

**<u>ක්‍රියාකාරකම්</u>**

1) පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. හුණුවටය නාට්‍යයේ මුල් රචකයා කවුරුන් ද ?

ii. එහි ඉංග්‍රීසි පිටපතේ නම කුමක් ද ?

iii. එය සිංහලට පරිවර්තනය කළේ කවුරුන් ද ?

iv. හුණුවටය නාට්‍යයේ චරිත කිහිපයක් නම් කරන්න.

v. මෙහි නඩු අසන නගරය කුමක් ද ?

vi. හුණුවටය නාට්‍යයෙන් ලබා දෙන පණිවිඩය කුමක් ද ?

2) පහත සඳහන් ප්‍රකාශ ඇසුරින් වගුවේ (අ) හා (ආ) කොටස් සම්පූර්ණ කරන්න.

| ප්‍රකාශ | (අ) කිව්වේ කවු ද ? | (ආ) කිව්වේ කාහට ද ? |
|---|---|---|
| (i) "උඹ වාසනාවන්තයි. මෙයා නියම නඩුකාරයෙක් නෙමෙයි." | | |
| (ii) "අපි දන්නවා. ඔය හැටි මතක් කර කර දෙන්න ඕන නෑ." | | |
| (iii) "ඊට කලින් මහාධිකරණය දැන ගැනීමට සතුටුයි මුන්නැහෙගෙ ගාස්තුව කීයද කියලා." | | |
| (iv) "මම මට පුළුවන් හැටියට දරුවව හදාගත්තා..." | | |
| (v) "දරුවා බලාගත්තේ මමයි හාමුදුරුවනේ රිදී පහකට !" | | |
| (vi) "දරුවා දෙකට ඉරන්න ද මට කියන්නේ ? මට බෑ එහෙම කරන්න." | | |

3) නාට්‍ය කලාව ඇසුරින් අසා ඇති පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. චතුර්විධ අභිනයන් නම් කරන්න.

ii. නාට්‍යෝචිත අවස්ථා යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද ?

iii. නාට්‍යයකට කතාවස්තුවක් තෝරාගැනීමේදී යොදා ගත හැකි අත්දැකීම් කිහිපයක් නම් කරන්න.

iv. මනමේ නාට්‍යය ඇසුරින් නාට්‍යෝචිත අවස්ථාවක් විස්තර කරන්න.

v. හුණුවටය කතාවේ නාට්‍යෝචිත අවස්ථාවක් විස්තර කරන්න.

vi. නාට්‍ය ඉදිරිපත් කරන ශෛලීන් දෙක හඳුන්වන්න.

vii. අභිඥාන ශාකුන්තලයේ රචකයා කවුරුන් ද ?

viii. සිංහබාහු හා හුණුවටයේ කතාව ඇසුරින් නාට්‍ය ශෛලීන්ට අදාළව පෙළ ගස්වන්න.

| | **හුණුවටයේ කතාව** | **සිංහබාහු නාට්‍යය** |
|---|---|---|
| **ශෛලිය** | | |
| **දෙබස්** | | |
| **හැසිරීම්** | | |
| **ඇඳුම් පැළඳුම්** | | |
| **සංගීතය** | | |
| **වස්තු විෂය / තේමාව** | | |

4) පහත සඳහන් අවස්ථා ඇසුරින් කැමති මාතෘකාවක් තෝරාගෙන නාට්‍ය පිටපතක් රචනා කරන්න.

- ජනකතාවක්
  **උදාහරණ :-** අන්දරේගේ කතා

- ජාතක කතාවක්
  **උදාහරණ :-** කුස ජාතකය

- පුවත්පත් විශේෂාංගයක්
  **උදාහරණ :-** වසංගත රෝග
  ගංවතුර
  නාය යෑම්

- ලැබූ අත්දැකීමක්
  **උදාහරණ :-** ජයග්‍රහණයක්

5) පහත දැක්වෙන නාට්‍ය නිර්මාණවල නිර්මාණකරුවන් නිවැරදිව යා කරන්න.

| **නාට්‍ය නිර්මාණ** | **නාට්‍යකරුවන්** |
|---|---|
| විකෘති | දයානන්ද ගුණවර්ධන |
| කැලණි පාලම | එදිරිවීර සරච්චන්ද්‍ර |
| තට්ටු ගෙවල් | හෙන්රි ජයසේන |
| සුබ සහ යස | බන්දුල ජයවර්ධන |
| ජනේලය | ආර්. ආර්. සමරකෝන් |
| නරි බෑනා | සුගතපාල සිල්වා |
| රත්තරං | සෝමලතා සුබසිංහ |
| බෙරහඬ | සයිමන් නවගත්තේගම |

## පිළිතුරු

## ක්‍රියාකාරකම් - තොරොක්කෝව

1) ර්යුනොසුකෙ අකුතගාවා සහ ජයන්ත විමලසේනයන් විසින්

2) තොරොක්කෝවේ නැග යෑමට නොහැකි වුවත් තල්ලු කිරීමටවත් ඉඩ ලැබේවි යැයි සිතීම.

3) ර්යෝහෙයි, ඔහුගේ බාල සහෝදරයා හා අසල්වැසි ළමයෙක්

4) කබල් ජැකට්ටුවකුත් යල් පැනපු පිදුරු තොප්පියකුත් ඇඳගත් උස කම්කරුවෙක්

5) තොරොක්කෝව තල්ලු කිරීමට ඉඩක් ඉල්ලන්නට

6) ජමනාරම් සුවඳ

7) පිදුරු සෙවිලි කළ තේ පැන් හලකට මුහුණලා

8) මිදි වැල මත වැටුණු බසින හිරුගේ ආලෝකය අඩුවනු දැකීමෙන්

9)
- “පාවහන් ගැලවී විසිවීමට ඉඩ හරිද්දී
- “කඳුළු ධාරා වැගිරෙන විට”
- “සුසුම් පිටකරමින් දුවන විට”
- “ලිස්සමින්, ගල්මුල්වල හැපෙමින් දුවන විට”

10)
- වැඩපොළ අඳුරේම දිස්වීම.
- පහන් දැල්වෙමින් තිබීම.
- බඩු ගබඩාව, බාබර් සාප්පුව ආලෝකයෙන් බැබළීම.

11) ඔහුට දැනුණු තනිකම නිසා

## ක්‍රියාකාරකම් - හුණුවටයේ කතාව

1) .

i. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්
ii. ද කොකේසියන් චෝක් සර්කල්
iii. හෙන්රි ජයසේනයන්
iv. ගෲෂා, සයිමන්, සෂාවා, අසඩක්, මයිකල්, නටාලියා
v. නුකා නුවර
vi. “දෙයක් වේ නම් යම් සුදුස්සාට ම අයිති විය යුතු”

2) .

i. (අ) අරක්කැමි ස්ත්‍රිය
(ආ) ගෲෂාට

ii. (අ) සයිමන්
(ආ) අරක්කැමි ස්ත්‍රියට

iii. (අ) අසඩක්
(ආ) 1 වන නීතිඥයාට

iv. (අ) ගෲෂා
(ආ) අසඩක්ට

v. (අ) අරක්කැමි ස්ත්‍රිය
(ආ) අසඩක්ට

vi. (අ) ගෲෂා
(ආ) අසඩක්ට

3) .

i.
- ආංගික අභිනය
- වාචික අභිනය
- සාත්වික අභිනය
- ආහාර්‍ය අභිනය

ii. ප්‍රේක්ෂකයාගේ සිතේ කුතුහලය හා ආතතිය උපරිමයෙන් කුළුගැන්විය හැකි අවස්ථා

iii.
- තමාගේ අත්දැකීම්
- නිර්මාණය කරගත් කතාවස්තුවක්
- ජාතක කතාවක්
- ඉතිහාස කතාවක්

iv. වැදි රජු කුමරිය අතින් කඩුව ගෙන කුමරා මරා දැමීම.

v. ගෲෂා සහ නටාලියා දරුවා දෙපසට අදින විට කා අතට දරුවා ලැබේවි ද යන්න

vi. ශෛලිගත හා ස්වාභාවික සම්ප්‍රදායන්

vii. කාලිදාස

viii.

| | **හුණුවටයේ කතාව** | **සිංහබාහු නාට්‍යය** |
|---|---|---|
| **ශෛලිය** | ස්වාභාවික | ශෛලිගත |
| **දෙබස්** | "මා ගියේ පයින්<br>දරුවා මගේ" | "මා පියා හැර දමා<br>යන්නෙ අප කෙලෙස දෝ" |
| **හැසිරීම්** | දරුවා රැගෙන වැල්පාලමෙන් යාම. | සිංහයා පැමිණ ලෙන් දොර හැර ඇතිබව දැන වේදනාවෙන් කෑගැසීම. |

| | | |
|---|---|---|
| **ඇඳුම් පැළඳුම්** | සයිමන් හමුදා ඇඳුම් ඇඳීම. | සිංහයා කේෂර සහිතව සිංහ විලාසය ගැනීම. |
| **සංගීතය** | සරල සංගීත ස්වරූපයක් | මද්දලය, සර්පිනා වාදන අනිවාර්ය වේ. තාලානුකූලව ගායනා සිදුකෙරේ. |
| **වස්තු විෂය / තේමාව** | සාමාන්‍ය ලෝකයේ ස්වාභාවික සිදුවීම් ඇසුරින් තේමාව සකස්වීම. | අතීත කතා, ජාතකකතාවක් ඇසුරින් කතාව ගොඩනැගේ. |

4) නාට්‍ය පිටපත සඳහා කතාවේ තේමාවට අදාළව
- චරිත කිහිපයක් තෝරාගන්න.
- භාෂාව, දෙබස් හා සංවාද ඇසුරින් කතාව ගොඩනගන්න.
- අවස්ථාවන් නාට්‍යෝචිතව ලිවීම.
- කතාවෙන් පණිවිඩයක් සමඟ කුතුහලයක්, හාස්‍යයක් ආදී වශයෙන් රසවත් බවක් එකතු කරන්න.

තවදුරටත් පෙළ පොත උපයෝගී කරගෙන පිළිතුරු සපයන්න.

5) .

| **නාට්‍ය නිර්මාණ** | **නාට්‍යකරුවන්** |
|---|---|
| විකෘති | දයානන්ද ගුණවර්ධන |
| කැලණි පාලම | එදිරිවීර සරච්චන්ද්‍ර |
| තට්ටු ගෙවල් | හෙන්රි ජයසේන |
| සුබ සහ යස | බන්දුල ජයවර්ධන |
| ජනේලය | ආර්. ආර්. සමරකෝන් |
| නරි බෑනා | සුගතපාල සිල්වා |
| රත්තරං | සෝමලතා සුබසිංහ |
| බෙරහඬ | සයිමන් නවගත්තේගම |